

'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු

| 60 වන කාණ්ඩය | බු. ව. 2561 බිනර මස පුර පසළොස්වක ද<br>ව්‍ය. ව. 2017 සැප්තැම්බර් 05 වන ද | 05 වන කලබ |
|---|---|---|

# "මිනිසා නො හද රටක් හදනු බෑ"



මිනිසා නො හද රටක් හදනු බෑ
හදමු අපේ රට මිනිසුන් ගෙන්
මිනිස් සිත් සතන් හැදුවොත් පළමු ව
මෙ රට සැදෙනු ඇත සව් සිරියෙන්

මඩිහේ මහ නා හිමියන් සමරන
අට වන ද අපි මේ මාසේ
ඒ උතුමාණන් වදහළ ඒ බස
පණ ගන්වමු සමගි ව නොලසේ

එක එක පිල්වල කුණු අගු පිල්වල
නො වැටී නො බෙදී දුර දැක්මෙන්
හෙළ බොදු මිනිසුනි එක පිලැ එක් වෙමු
අනතුර අත ළඟ බව දැන්මෙන්

- අනඳ



# සිරි වජිරාරාම දහම් පාසලේ සියවස් සමරුව

සිරිලක පැරණි දහම් පාසලක් වන බම්බලපිටියේ සිරි වජිරාරාම දහම් පාසලට 2018 අගෝස්තු 18 වනදට හරියට ම සියවසක් සපිරෙයි. ඒ නිමිත්තෙන් වසරක් පුරා ක්‍රියාත්මක වන වැඩ සටහන් මාලාවක් දහම් පාසලේ කළමනාකරණ මණ්ඩලය සැලැසුම් කර ඇත. පසුගිය අගෝස්තු 18 දින සවස විශේෂ ආශීර්වාදාත්මක බෝධි පූජා පින්කමකින් සියවස් ජයන්තියේ ආරම්භය සනිටුහන් කැරිණ.

ශ්‍රී ලංකාවේ සමස්ත දහම් පාසල් පද්ධතියේ නව පිවිසුම් දෙරකට කිසියම් සවිමත් පදනමක් දැමීම සියවස් සමරුවේ එක් අභිප්‍රායයෙකි. දහම් පාසල් අධ්‍යාපනයට එළි වැටක් දල්වමින් අඩු පහසුකම් ඇති ව උනන්දුවෙන් පවත්වාගෙන යනු ලබන දහම් පාසලකට ප්‍රතිපත්ති පෝෂණය සහිත ව පහසුකම් සලසා දීම එහි ලා වැදගත් වන තවත් අරමුණකි.

පරමපූජ්‍ය පැළෑනේ සිරි වජිරඥාණ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ පුරෝගාමී අනුශාසකත්වයෙන් 1918 අගෝස්තු මස 18 වන ද ඇරැඹුණු "වජිරාරාම දහම් පාසල" නමැති ධර්ම කේන්ද්‍රය, අගනුවර හැදෙන වැඩෙන සිංහල බෞද්ධ දරු - දැරියනට අමිල ධර්ම කේන්ද්‍රයක් වූයේ

ධර්ම භාණ්ඩාගාර වැනි උතුම් සංඝපිතෘන් වහන්සේ ලා ගේ ආදර්ශවත් අනුශාසනය හා ආකර්ශනීය උපදේශනය එහි නොමඳ ව රැඳුණු නිසා ය.

අගනුවර සාමාන්‍ය පවුල්වල මවුපියවරුන් පමණක් නො ව, ප්‍රභූ පවුල්වල දෙමවුපියන් ද තම දරුවනට ආගමික පරිසරයක් යටතේ අනාගත ලෝකය නිර්මාණය කැර දීමේ වැදගත්කම දුටුවේ එ වක ඉඩ කඩ, ගොඩනැගිලි පහසු කම් පවා නො තිබුණු මේ පුංචි ආරාමයේ විකසිත දහම් සුවඳ ඔවුන් මැනැවින් ආඝ්‍රාණය කළ නිසා ය. ඩී. එස්. සේනානායක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිවරුන් සිය දරුවන් මෙම දහම් හෙවණෙහි කුඩා වියේ පටන් හික්මවූයේ ද, ජේ. ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, බර්නාඩ් සොයිසා, ලලිත් ඇතුලත්මුදලි යන කීර්තිමත් රාජ්‍ය නායකයනට බුදු දහමේ ශික්ෂණ හිමිකැර දෙනු ලැබූයේ ද, තවත් බොහෝ වියතුනට, සමතුනට, පෙදෙස් වැසියනට දහම් කෙම් බිමක් වූයේ ද භෞතිකය අබිබවා අධ්‍යාත්මයට නැඹුරු වූ දහම් දිවි මඟක් මේ පින්බිම තුළ එළි පෙහෙළි වූ නිසා ය.

පැළෑණේ මහ නාහිමියන් ගේ ඇවෑමෙන් විදුරු අරම පින්බිමේ අදිපතියාව හෙබැවූ අතිපූජ්‍ය නාරද මාහිමියෝ සිරි වජිරාරාම දහම් පාසලේ ඉදිරි දියුණුවට අත්‍යන්ත ආලෝකයක් ද රැකවරණයක් ද ලබා දුන්හ. දරුවනට දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කැරුණේ උන්වහන්සේ ගේ පරිශ්‍රමය නිසා ය. අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමි, අතිගරු කඹුරුගමුවේ මහානාම මාහිමි, අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුල මාහිමි, අතිගරු ගංගොඩවිල සෝම හිමි වැනි

මහ යතිවරුන් නිසා ද සිරිමෙවන් පියසිංහ මහතා වැනි පාලනයෙහි හා අධ්‍යාපනයෙහි දක්ෂ ගුරු භවතුන් නිසා ද දහම් පාසල එදා මෙදාතුර ලද සුපෝෂණය වචනයෙන් කිව නොහැකි තරම් ය.

ඒ උතුමන් හෙළි කළ දහම් මඟ ඔස්සේ වඩාත් ප්‍රායෝගික ව, ළමා මනස දහමින් තෙදවත් කිරීමේ සැලැසුම් ඇති ව, දහම් ගුරුකමේ වටිනාකම වටහාගත් ආචාර්ය මණ්ඩලයකින් සන්නද්ධ ව පැවැත්වෙන වත්මන් සිරි වජිරාරාම දහම් පාසල දවසින් දවස දහම් කෙත අස්වද්දමින් ඉදිරියට යන්නේ සැබැවින් ම එහි සියවසක පුරාණයට නව ජීවනයක් ලබා දෙමිනි.

මෙම සියවස් සමරු ජයන්තියේ තේමා පාඨය වී ඇත්තේ "**සදහම සවිමත් පරම්පරාවක් - මිනිසි දහම් සරු ශ්‍රී ලංකාවක්**" යන්න යි. ඒ තේමා වදන සැබෑ අරුතක් ලෙසින් මල් පල ගන්වන්නට ද, සියවස් ජයන්තිය සාර්ථක ව උත්කර්ෂණයට පත් කරන්නට ද ශාසනාලයයෙන් එක් වන ලෙස සිරි වජිරාරාමය ළමා - වැඩිහිටි හැම දෙනාට ම ඉත සිතින් ශාසන දයාවෙන් ආරාධනය කරයි.





# පැළෑණේ සිරි වජිරඤාණ මහනා හිමි නම් වූ හෙළ පැදි පබඳුවාණෝ

***බම්බලපිටිය සිරි වජිරාරාමවාසී ත්‍රිපිටකාචාර්ය***
***ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත***
***වේරදූවේ මහින්ද ස්වාමීන් වහන්සේ විසිනි***

පරහිතකාමී ශ්‍රේෂ්ඨ පුරුෂයන් ගේ මෙලොව පහළවීම ඉතා දුර්ලභ ය. ඈත අතීතයේ සිට ජාතියේ පිනට පහළ වූ එබඳු ශ්‍රේෂ්ඨ යුග පුරුෂයන් අතර ගිහි පැවිදි දෙපිරිස ම වෙති. ඔවුන් විසින් රට දැය සමය වෙනුවෙන් සිදු කරන ලද සේවාව මිල කළ නොහැකි ය. එම ශ්‍රේෂ්ඨ යුග පුරුෂයන් අතර සිල්වත්, ගුණවත්, නැණවත් පඬිරුවනක් වූ පැළෑණේ සිරි වජිරඤාණ මහ නා හිමියන් ගේ ශ්‍රී නාමය ද තවත් බොහෝ කාලයක් හුදී ජන මනසෙහි රැඳී පවතිනු නො අනුමාන යි. තම ජීවිතය ම පරාර්ථ සේවාව වෙනුවෙන් කැප කළ, පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් වහන්සේ ගේ අපවත් වීමෙන් මෙම මස (සැප්තැම්බර්) 21 වන දිනට වසර 62 ක් සම්පූර්ණ වන අතර, ඒ නිමිති කොට ගෙන මෙම ලිපිය ලියැවෙන්නේ මහා නාහිමියන් ගේ ගුණ අනුස්මරණය කිරීමක් වශයෙනි.

පැළෑණේ සිරි වජිරඤාණ මහ නා හිමියෝ ශ්‍රේෂ්ඨ ධර්මාචාර්යවරයකු, ධර්ම දේශකයකු පමණක් නොව, මහා ලේඛකයෙක් ද වූහ. සමස්ත සමාජය යහමගට ගැනීම සඳහා උන්වහන්සේ විසින් දක්වන ලද ශාස්ත්‍රීය දායකත්වය ඉතා ප්‍රශස්ත

ය. එම ශාස්ත්‍රීය දායකත්වයෙහි එක් පැතිකඩක් ලෙස උන්වහන්සේ ගේ පද්‍යකරණය පෙන්වා දිය හැකිය. සරල වූත් සුගම වූත් එමෙන් ම වියත්, රසවත් භාෂා ශෛලියකින් රචනා කරන ලද එම පද්‍ය කිහිපයක් තෝරාගෙන උන්වහන්සේ පද්‍යකරණයෙහි ලා දැක්වූ චාතුර්යය ඇගයීම මෙම ලිපියේ අරමුණ යි.

පැළෑණේ මහ නාහිමියෝ පද්‍ය රචනයෙහි ලා දැක්වූ පිරිපුන් බව නිරන්තරයෙන් ම පැසසිය යුත්තකි. සසරින් ගෙනා කාව්‍ය කුශලතාවකින් යුත් උන්වහන්සේ මිහිරිපැන්නේ කවි පරපුර උද්දීප්තියට පත්කළ මහ කිවියකු ලෙස හැඳින්වීම යුක්තියුක්ත ය. සමාජයෙහි සෑම පැතිකඩක් ම පාහේ අරමුණු කොට රචනා කරන ලද එම පද්‍ය රචනා,

ළමා පද්‍ය
පරිවර්තන පද්‍ය
උපදේශ පද්‍ය යනුවෙන් වර්ගීකරණය කළ හැකි ය.

ළමා පරපුර ගුණදහමින් පෝෂණය කිරීමේ පරමාධ්‍යාශයෙන් 1937 දී අරඹන ලද බෞද්ධ ළමයා සඟරාව අද දක්වා ම පැවත එන උදාර සමාජ සාර සංග්‍රහයකි. පැළෑණේ මහ නා හිමියන් ළමා පරපුර නංවා සිටීමට එම කුඩා සඟරාව උපයෝගී කරගත්තේ නොයෙක් දහම් ලිපි, කතන්දර මෙන් ම ළ-ගන්නා පද්‍ය බන්ධන ද සමඟිනි.

කුඩා දරුවකු යහපත් හෝ අයහපත් වන්නේ ළමා අවධියේ සිට ය. තමා හට ඉතා සමීප ව ඇසුරු කරන්නට ලැබෙන මවුපියන්, වැඩිහිටියන්, යහළුවන් හා අනෙක් බාහිර පුද්ගලයෝ ළමා මනස හමුවේ ඉතා වැදගත් සාධක වෙති. සත්තිගුම්බ ජාතකය මේ සඳහා කදිම නිදසුනකි. තද වර්ෂාවක් නිසා තම කූඩුවෙන් ඉවතට විසිවන ගිරා පැටවුන් දෙදෙනාගෙන් සොරුන් ඇසුරට පත් ගිරවා පහත් හැසිරීමෙන් යුක්ත වූ අතර, තවුසන් ඇසුරට පත් ගිරවා උසස් හැසිරීමෙන් යුක්ත විය. එබැවින් යහපත් හෝ අයහපත් දරුවකු

බිහිවීම බොහෝ සෙයින් ඇසුරට ලැබෙන පුද්ගලයන්ට අනුව තීරණය වන බව පැහැදිලි ය. එබැවින් ළමා අවධියේ සිට ම දරුවන් ගුණ ධර්මවලට හුරු කිරීම මවුපිය, වැඩිහිටි සියලු දෙනා ගේ ම යුතුකම වන්නේ ය. එසේ ම එම හුරුව ලබා දිය යුත්තේ ක්‍රමානුකූලව හා උපක්‍රමශීලීවයි. පැළෑණේ මහ නාහිමියෝ ඒ සඳහා ස්වකීය පද්‍ය බන්ධන සාර්ථක ක්‍රමවේදයක් කොට ගත්හ. සමාජයට වැඩදායී දරුවන් බිහි වන්නට නම් දැනුම, බුද්ධිය පමණක් නොව, ගුණධර්ම ද වර්ධනය විය යුතු ය. එහිලා මූලික වශයෙන් බුදුන්, දහම්, සඟුන් යන තෙරුවන පිළිබඳ ශ්‍රද්ධාව, ගෞරවය දියුණු විය යුතුය. එසේ ම ඉහත කී ලෙස මවුපියන් පිළිබඳ ගෞරවය මෙන් ම, ගුරුවරුන්, වැඩිහිටියන් කෙරෙහි ද තම චර්යාවන් යහපත් කර ගත යුතුය. නිරන්තරයෙන් ම ගුණගරුක ළමා පරපුරක් බිහි කිරීම අරමුණු කොට ගත් පැළෑණේ මහ නා හිමියන්ගේ

බුදුරුවනට බැති දැරුවෝ        මව්පියනට පෙම්        කරුවෝ
දමුරුවනට රැති කැරුවෝ        ගුරුවරුනට කී        කරුවෝ
සඟුරුවනට ගැති යුරුවෝ        වැඩිමලුනට ගරු        සරුවෝ
වෙති සොඳ සිංහල දරුවෝ        වෙති සොඳ සිංහල        දරුවෝ

වැනි පද්‍ය බන්ධන තුළින් උන්වහන්සේගේ පරමාර්ථය ඉතා පැහැදිලිවේ. පළමු පද්‍යයෙන් බුදුන්, දහම්, සඟුන් යන තෙරුවන විෂයෙහි ඉතා යහපත් ලෙස හැසිරෙන දරුවන් ඉතා යහපත් සිංහල දරුවන් බවත්, දෙවන පද්‍යයෙන් මවුපියන්ටත්, ගුරුවරුන්ටත්, වැඩිමහලුන්ටත් ආදරය දක්වන, ගරුසරු කරන දරුවන් ඉතා යහපත් සිංහල දරුවන් බවත් දක්වා තිබේ. එම පද්‍ය තුළින් දරුවකු ළඟ තිබිය මූලික ගුණධර්ම කිහිපයක් ඉස්මතු කොට තිබේ.

රට, දැය, සමය කුමන අයුරකින් හෝ විපතට පත් වූ විටෙක ඉදිරියට එන වීරෝදාර චරිත ගොඩනැගෙන්නේ ද ඉතා අඩුවෙනි. ළමා මනසෙහි කවදත් රැඳී ඇති වීරයා වනුයේ මද්දුම බණ්ඩාර යි.

එබඳු විශිෂ්ට චරිත ගොඩනැගීම අනිවාර්යයෙන් ම සිදුවිය යුත්තකි. එසේ නොවූ කල්හි රට, දැය, සමය රැකගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවනු ඇත. එබඳු සුර වීර චරිත බිහිකිරීම හා කුඩා අවධියේ සිට ම දරුවන් තුළ පෞරුෂය දියුණු කිරීම වැනි දෑ අරමුණු කොට ගනිමින් ද උන්වහන්සේ පද්‍ය රචනා කොට ඇති අතර, ඒ වනාහි පැළෑණේ මහ නා හිමියන්ගේ පද්‍යකරණයෙහි සුවිශේෂී පැතිකඩකි.

වීරිය දිරි ගුණ දැරුවෝ
කාරිය කරන සුරුවෝ
සූරිය සරි තෙද ගරුවෝ
ආරිය සිංහල දරුවෝ

දරුවෙනි ගුණෙනු'තුම් - සිය රටට ජාතියටත්
දිවි පුදා මෙහෙ කරනට - නිතර ම ඉටා ගන්නේ

මෙම පද්‍යයන් තුළින් ළමා අවධියේ සිට ම වර්ධනය විය යුතු වීරත්වය, පෞරුෂය පිළිබඳ ව අවධාරණය කොට තිබේ.

සාහිත්‍යය නිර්මාණයක් මගින් ළමා පරපුරට ගුණදම් දායාද කිරීම පහසු කටයුත්තක් නොවේ. කුඩා දරුවන්ගේ මනස ඉතා මොළොක් ය. එබැවින් සාහිත්‍යය හරහා ළමා පරපුරට ගුණදම් දායාද කිරීම කළ හැක්කේ අති දක්ෂයකුට පමණි. භාෂා ඥානයෙන් හා පාණ්ඩිත්‍යයෙන් යුත් උන්වහන්සේ ළමා මනස ඉතා මැනවින් හඳුනාගෙන ඔවුනට ගැළපෙන බස් වහරක් ඒ සඳහා යොදාගත්හ.

සුමුදු සුවඳ සුළඟ හමා
පුබුදු මලෙහි බමර හමා
උදය පිබිදි බොළඳ ළමා
පිරිස දෙ ඇස පොතට යොමා

සිංහල සාහිත්‍යයේ මුල සිට ම ඉතා ප්‍රශස්ත ගද්‍ය හා පද්‍ය කෘති රචනා වී ඇත. ඒවා රචනා කළ කතුවරු බොහෝ අවස්ථාවන්හි තම විෂය සඳහා ජාතක කථා, චරිතාපදාන, ධර්මෝපදේශ වැනි දෑ තෝරාගත්හ. පැළෑණේ මහ නාහිමියන් ද මේ ක්‍රමය අනුගමනය කළ අවස්ථා දැකිය හැකිය. එහිදී උන්වහන්සේ විසින් බුද්ධ දේශනාවෙහි එන යම් යම් දහම් කොටස් පද්‍යයට නගා ළ-ගන්නා සුලු අයුරින් සමාජයට දායාද කොට තිබේ. එය උන්වහන්සේ ඉතා රුචියක් දැක්වූ ක්‍රමවේදයක් බව පැහැදිලි ය. එසේ ම උන්වහන්සේ ඒ සඳහා විශිෂ්ට සාමර්ථ්‍යයක් දක්වා තිබේ.

කයිනුත් සුවැත්තෝ - කිසිත් උවදුරු නැත්තෝ
වෙත්වා සියලු සත්හු මැ - සුවපත් වූ සිතැත්තෝ

තම එක ම පුතු දිවි - පුදා රක්නා මව සේ
හැම සතුන් වෙත අපමණ - මෙත් සිත වඩනු මැනැවි
(කරණීයමෙත්ත සූත්‍රය)

පාළි ධම්මපදයේ වර්ග පහළොවක ගාථා සඳහා විවරණ වශයෙන් සපයා ඇති පද්‍ය පඞ්ක්තිය ද ඉහත කී කාරණාව සනාථ කිරීමෙහි ලා කදිම නිදසුනකි.

ඉදින් බොහෝ දම් දෙසනේ නමුත් ඒ
දහම් කරන්නේ නො වෙ නම් පමත්තේ
අනුන් ගොනුන් නිත් ගණනා ගොපොල්ලෙ'ව්
මහාණුවම්හී කොටැසී නො වේ හේ

මූලික ධර්මාර්ථයට හානියක්, අඩුවක් නොවන සේ රචනා කොට ඇති මෙවැනි පද්‍ය මගින් ද, මහ නා හිමියන් විසින් කරන ලද එළු සිලෝ වැනි පරිවර්තන කෘතීන් මගින් ද, සකු පරිවර්තන මගින් ද උන්වහන්සේ පරිවර්තන පද්‍යකරණයෙහි ලා දැක්වූ කුශලතාව මැනවින් පසක් වෙයි.

තව ද, උපදේශ පද්‍ය රචනයෙහි ලා පැළෑණේ සිරි වජිරඥාණ මහ නා හිමියන් පෑ දක්ෂතාව පැරැණි උපදේශ පද්‍ය රචකයන් ගේ සමත්කම් පවා ඉක්මවා ඇතැයි කීම කිසිසේත් ම අතිශයෝක්තියක් නොවේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළ විවිධ ධර්මෝපදේශ ද, මනුස්මෘතිය, පංචතන්ත්‍රය, හිතෝපදේශය හා තවත් සංස්කෘත ශතක ග්‍රන්ථ ද, නොයෙකුත් සිංහල උපදේශ ග්‍රන්ථ ද මැනවින් අධ්‍යයනය කළ මහ නා හිමියෝ ඒ සමස්තය ඇසුරින් වටිනා උපදේශ පද්‍ය බොහොමයක් රචනා කළහ. ඒවා ළමා පරපුරට පමණක් නොව, වැඩිහිට පරපුරට ද අතිශය ප්‍රයෝජනවත් ය. මේ සමස්ත සමාජයට ම සරිලන සේ කළ උපදේශාත්මක පද්‍ය දෙකකි:

නම කැත නොවන සේ - ගරු නම්බුව රැකෙන සේ
මතු දියුණු සැලසෙන සේ - බලාගෙන හැසිරෙන්නේ
කරතොත් කරපන් හරියට - බැරි නම් පලයන් අහකට
අත පත ගාමින් වටපිට - බලමින් ළතැවෙන්නෙ කුමට

සමස්තයක් වශයෙන් ගත් කල ශබ්ද රසයෙන්, අර්ථ රසයෙන් හා ඇතැම් විට හාස්‍ය රසයෙන් ද යුක්ත වූ, උගත් නූගත් කාගේත් චිත්තාරාධනය කිරීමට සමත් වූ පැළෑණේ සිරි වජිරඥාණ මහ නා හිමියන් ගේ පැදි පබඳ වනාහි උන්වහන්සේ විසින් කරන ලද ශාස්ත්‍රීය සේවාවෙහි ඉතා සුවිශේෂී අවස්ථාවක් බව සිහි ගන්වමින්, මහ නා හිමියන් විසින් ඉතා කුලුණු සිතින් ළමා පරපුර දිරි ගැන්වූ මනරම් පද්‍ය පුෂ්පයකින් මේ ලිපිය අවසන් කරමු.

තම බල නැණ පමණ - දැනැ ගෙනැ මෙහෙ කරන්නේ
හිරු මෙන් නො හැකි නම් - කණමැදිරි මෙන් බැබළෙවු



# දුන් දැ ගැනීම

*රංජනී සමරදිවාකර නැන්දා විසිනි*

සතිමත් වෙමුද කියන ලිපියෙන් පටන් අරගෙන, ඒ සඳහා පසුබිම සකස් කරගෙන යන ගමන් අපි දෙවෙනි සිල් පදයටත් ළඟා වුණා. ම්... කාටදෝ කොතනදෝ වැරදීමක් වෙලා වගෙයි නේද? අපි උදේ සමාදන් වුණු සිල් පදය කියෙව්වෙ ඔහොම නෙවෙයි නේ, මාතෘකාවෙ අකුරක් හැලිලා, එක්කො ලියන්න අමතක වෙලාදෝ කොහේද? කියල පුතාලා දූලට හිතුණ නේ. අපි ලිපිය දිගටම කියවගෙන යමුකෝ. මාතෘකාව වැරදි නම් ඊළඟ පාර නිවැරදි කරමු.

‘දුන් දැ’ කිව්වම පුතාලා දූලට මොනවද මතක් වුණේ? තවත් කෙනෙකු දුන් දෙයක් නේ. අපිට අනිත් අය කොච්චර දේවල් දෙනවද? දරුවන්ට කී දෙනෙකුගෙන්, කොච්චර නම් දේවල් ලැබෙනවද? අම්මලා තාත්තලාගෙන්, ආත්තම්මලා සීයලාගෙන්, නෑදෑයන්ගෙන්, යහළුවන්ගෙන් උපන් දිනයක දී, නැතිනම් විභාගයක් පාස් වුණාම තෑගි කන්දක් හම්බ වෙනවා. පුතාලා දූලට එදාට නින්ද යන්නෙත් නෑ. ඊළඟ දවසේ ඉස්කෝලෙ ගිහින් යාළුවන්ට තෑගි පෙන්නනකම් ඉස්පාසුවක්, ඉවසිල්ලක්, ඇත්තේම නෑ. අරගෙන යන්නෙත් තමන් ආසම කරන, වැඩිම වටිනාකමක් තියෙන තෑග්ග නේද?

තෑග්ග පොත් බෑග් එකේ දාගෙන, බිම වැටෙනවට බයේ හයියෙන් අල්ලගෙන, කවුරුත් උදුර ගනියි කියල බයෙන් තුරුල් කරගෙන, පරෙස්සම් කර ගෙන ගිය විදිය දැනුත් මැවිල පේනවා වගෙයි. එහෙම ගිය වෙලාවල හිතට දැනුණ ආඩම්බරේ, සතුට දැනුත් දැනෙනවා නේද? පුංචි පුතාලා දූලා ඔය තෑග්ග යාළුවන්ට පෙන්නලා, කොයිතරම් අහිංසක සතුටක් ද ඒ විඳින්නෙ. එදට පංතියෙ වීරයත් ඔයා නේද?

හවසට ගෙදර ඇවිල්ල කාල බීල ඉවර වෙලා, විස්තරේ අනෙත් අයත් එක්ක කියන ගමන් ආයෙත් අර සතුට අලුත් කරගන්න හිතා ගෙන, බෑග් එක අරින්නෙ හරිම ආසාවෙන්. මහ මෙරක් තරම් ලොකු ආසාවකින් බෑග් එක ඇරල බලන කොට තෑග්ග නැති වුණොත්? අතත් වෙවුලනවා. මුළු පොත් බෑග් එක ම එළියට ඇද ඇද, ආයෙ ආයෙත් බලනවා. ආයෙත් බලනවා, කණපිටත් හරවලා බලනවා. බයත් හිතෙනවා. හිතත් වෙවුලනවා. හොයා ගන්න බැරි වුණාම, 'අනේ අම්මේ කවුදෝ මගේ තෑග්ග හොරකම් කරලා' කියල අඬා ගෙන යන්නෙ, උහුලා ගන්න බැරි තරම් හිත් වේදනාවකින් නේද? ඇස් දෙක උල්පතක් වෙලා, කඳුළු ගංගාවක් ගලනවා. දකින අයටත් දුකයි.

පුතාලා දූලට ඔය දැනෙන දුකට හේතුව මොකක් ද කියල පොඩ්ඩක් විමසලා බලමු. පුතාලා දූලට දුන් දෙයක්, පුතාලගෙන් අහන්නෙත් නැතුව, පුතාල කැමැත්තෙන් දුන්නෙත් නැතුව, වෙන කෙනෙකු අරගෙන. අපි ඕකට මොකක්ද කියන්නෙ පුතා? නොදුන් දේ ගැනීම නැතිනම් සොරකම් කිරීම කියල නේද? මොකක්ද සිදුවෙලා තියෙන්නෙ. 'දුන් දෑ' නොදුන් කෙනෙකු ගැනීමක්. නොදුන් දේත් එකක්ම එයා ඒ කෙනාගෙ සතුටත් හොරා අරගෙන නේද? අපි හැම කෙනෙක් ම ඔය

අවස්ථාවලට මූණ දීල තියෙනවා. සමහර වෙලාවට දැනුත් මූණ දෙනවා. පුංචි ද ලොකු ද කියල කිසිම වෙනසක් නෑ පුතේ. එකම වෙනස ලොකු වෙන්න වෙන්න, ලෝකෙට ඇහෙන්න කෑ ගහල අඬන්නෙ නෑ. ඒත් හිත ඇතුළෙන් අඬා වැටෙනවා. ඒක ඇහෙන්නෙ අනිත් කෙනාගෙ දුක් වේදනා අඳුනන අයට විතරයි පුතේ දුවේ. අනිත් කෙනාගෙ දුක වේදනාව අඳුන ගන්න හැකියාවට, වයස් සීමාවකුත් නෑ. සමහර පුංචි දරුවන්ටත් පුළුවන්. සමහර වෙලාවට අවුරුදු අසූව අනූව වුණු අයටත් අමාරුයි. එහෙම තමන්ගෙ දුකේ වේදනාව අඳුනන කෙනා විතරයි තවත් කෙනෙකුගෙ දෙයක්, කිසිම දවසක අයිතිකාරයගෙ අවසරයක් නැතුව, ඒ අයට නොකියා නොගන්නෙ පුතේ දුවේ.

සොරා ගන්න දෙය ලොකු ද පුංචි ද කියල වෙනසකුත් නෑ පුතා. අයිති කෙනාට තමන්ගෙ මොන දේත් වටිනවා. තමන්ගෙ පෑනක්, පැන්සලක්, මකන කෑල්ලක් ළඟ ඉන්න යාළුවෙක් හරි ගත්ත වෙලාවට, සමහර ළමයි මරා ගන්න හදනවා දැකලා තියෙනවා නේ. ඇයි ඒ? තමන්ගෙ පුංචි දෙයට වුණත් හැම කෙනෙක්ම ආසයි පුතේ. ඒ නිසා සතුටෙන් ඉන්න කැමති නම් කිසිම දවසක තවත් කෙනෙකුගෙ පුංචි දෙයක්වත් ඒ අයට නොකියා නොගන්න පරෙස්සම් වෙමු.

අදට අපි මේ ලිපිය මෙතනින් නවත්වමු. එතෙක් මේ කියූ දේ හොඳින් මතක තියා ගෙන, ඒ යහගුණය ජීවිතේට එකතු කර ගෙන, පුතාලා දූලත් සතුටින් ඉන්නා අතරේ ම අනිත් අයගෙ සතුටටත් හානි නොකරන්න පරෙස්සම් වෙන්න.

**අපේ පුංචි දූ-පුතුන්ට බුදු සරණයි..!**



# ඉන්ද්‍රකීලය යි හිමි සඳුනේ

(අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ
මහ නා හිමියන් ගේ 14 වන ගුණ සමරුව නිමිත්තෙනි)

***වසන්තා ගීගනගේ නැන්දා විසිනි***

දකුණු සිරිලක මඩිහෙ ඉපදී
සසුන'ඹර දිලි මිණි පහන වී
උතුම් මිනිසත් බව දිනූ සමිඳේ
වඳිමු ගිලෙමින ඔබේ ගුණ මුහුදේ
සරල බසෙකින් දම් දෙසූ සමිඳේ
දහම් ලැදි හැම හදේ රැඳි සමිඳේ

"රට හදනු බැහැ නො ම හද මිනිසා
හදමු රට හදමින් ම ඒ මිනිසා"
රුවන් එ වදන් දැයට දුන් සමිඳේ
මඩිහෙ පැනසී මහා නා සමිඳේ

දිවැස් නුවණින් කුලුණු හදකින්
දැයේ මතු අනතුරු බලා
හිමි කියූ බස නො සැලකූ පව
විඳිමු අපි අසරණ වෙලා

සිහ රජෙකු සේ නොසැලුණේ - පිළිවෙතින් ම ය සැරසුණේ
සඟ රජෙකු සේ බැබළුණේ - විදුරු'රම ඉන් සුදිලුණේ
කියම් කෙලෙසක සමිඳු මෙහෙවර - දැයට කළ නොමිනී
උතුම් සඟ ගුණ මහිම සිහිකර - පුදමු හද බැතිනී



# සැබෑ මානව දයාවක් උදෙසා පාරමිතා පරමාදර්ශය

*සිරි වජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය*
*ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍යපාද මීගොඩ සුඛිත හිමිපාණන් විසිනි*

***පසුගිය කලබ හා සබැඳේ...***

රුවන්මැලි සෑයටත්, ජේතවනාරාමයටත්, සීගිරියටත්, පරාක්‍රම සමුද්‍රයටත් වඩා සාඩම්බර විය හැකි උදාර මානව චර්යා සම්ප්‍රදායයක් අප සතු විය. එය එසේ නො විණි නම් රුවන්මැලි සෑයත්, ජේතවනාරාමයත්, සීගිරියත් පරාක්‍රම සමුද්‍රයත් වෙනුවට මේ පොළොව මත මනුෂ්‍ය ධර්ම මරා දමමින් ටජ්මහල්, චීන මහා ප්‍රාකාර, පිරමීඩ ඉදිවීමට ඉඩ තිබිණි.

ඒ මහා මානව සම්ප්‍රදාය අද මත්වතුර, කෘමි නාශක, සුහුරු ජංගම දුරකථන, ක්ෂණික ආහාර කඩ, මෙගා නාට්‍ය මාලා, එෆ් එම් නාළිකා, අවරගණයේ සමාජ ජාල වෙබ් අඩවි ආදී මෙකී නොකී විකෘතීන් විසින් ආක්‍රමණය කොට හමාර ය. ප්‍රකෘතිය සොයා ගත නොහැකි තරමට විකෘතිය ප්‍රකෘතිය සේ සම්මතව ඇත. යළි අපට එම සරල අවශ්‍යතාවන්ගෙන් පිරිමැසුණු, අල්ප අපේක්ෂාවන්ගෙන් යුතු, ස්වභාව ධර්මයේ සංසිද්ධීන් උපේක්ෂාවෙන් ඉවසන නොවහල් ගැමි ජන ජීවිතයට සංක්‍රමණය වීම දුර්ගමයක් තරමට ම දුරස්ථ ය.

එම ජීවිතය පිළිබඳ මානව විද්‍යා කෞතුකාගාරවල දී අතීත කාල ආඛ්‍යානයෙන් කතා කිරීමට සිදු වන දිනය වැඩි ඈතක නොවේ. වේගයෙන් ගොඩනැගෙන මේ නව සමාජය තුළ එම බරපතළ අභිමිවීම්වලට විසඳුමක් ද නැත. මෙම පරිභෝජනවාදී සමාජය තුළ තරගය සාමාන්‍ය පැවැත්ම හා සම්බන්ධ අත්‍යවශ්‍ය කාරණයකි. "සිය ස්ථාවරත්වය ගොඩනගා ගත හැක්කේ අනෙකා අතික්‍රමණය කිරීමෙන් පමණි" යන්න මෙම නව සමාජයේ න්‍යාය වී ඇත. මෙහි ජය පරාජය තීරණය වන්නේ ධනය හා බලය වෙනුවෙන් ධනය හා බලය යොදන ප්‍රමාණයට අනුව ය. මේ තුළ සදාචාරය පිළිබඳ සංකල්පයක් හෝ පුද්ගලයා ස්වයං සංවරයට පමුණුවන ආචාරධර්ම සම්ප්‍රදායයක් නැත. ඇත්තේ එම සමාජය විසින් ම එම සමාජයේ විකෘති පැවැත්ම පවත්වා ගැනීම පිණිස සම්මත කොට ගත් නීති, රීති, දඬුවම් ක්‍රමයක් පමණි. මානසික පීඩනය, මානසික රෝග, භයානක සමාජ රෝග, පිළිකා, හෘදයාබාධ, දියවැඩියාව මේ නව සමාජය ලද තිළිණයෝ ය. සිංගප්පූරුව, ලංකාව දෙස බලා දියුණු වී යැයි ද තුන්වන ලෝකයේ සිට පළමුවන ලෝකයේ රටක් වී යැයි ද අපි උදම් අනමු. එහෙත් ලෝකයේ වැඩිම පීඩනයක් සහිතව සිටින ජනයා අතරින් සිංගප්පූරු වැසියෝ ද එක් පිරිසකි. මහ මඟ, දුම්රිය, බස් රථය, රෝහල ආදී සෑම තැනක දී ම බොහෝ මිනිසුන්ගේ ලෝකය ජංගම දුරකතනය යි. ලාංකේය සමාජයේ වැරදීමෙන්වත් සිදු නොවූ පරිදි මහ මඟට දිව යද්දී රිය අනතුරකට ලක් වූ සිඟිති දරුවෙකු මහ මග පණ අදිද්දී ඒ දෙසවත් බලන්නට අවකාශ නොමැතිව ජංගම දුරකතන ඔබමින් යන මිනිසුන් රැසක ගේ කඩඑ දර්ශන සහිත විදෙස් වීඩියෝවක් පසුගිය කාලයේ අන්තර්ජාලයේ දක්නට ලැබිණි. අප දියුණුව යැයි අරුත් ගැන්වූයේ මෙය ද? සමස්ත මානව සමාජයට ම බරපතළ ලෙස වැරදි ගමන් මඟකට බැසගත් සැටියකි! මහා වනාන්තර මතු නො ව පුරා

විද්‍යා සංරක්ෂණ භූමි ද ඩෝසර් කොට මහ පොළොව විකුණති. සතුන් මරා පැකට් කරති. ගංගා ඇළ දොළ සිඳෙන තුරු වතුර බෝතල් ගසා විකුණති. මිනිසා මිනිසාට එරෙහිව ජාති. ආගම්, වර්ණ ආදියෙන් බෙදී යුද වදිද්දී සිංහලයා ශ්‍රී ලාංකිකයන් ලෙස නාමකරණය වුව ද සත්‍ය නම් අපිදු පටු ගෝත්‍ර වාදයෙන් තව ම මිදී නොමැති බව යි. දෙමළ, මුස්ලිම් ජාතීන් සමඟ සමගි දාමයෙන් බැඳිය යුතු යැයි සංහිඳියාව, සමානාත්මතාව හා සර්වාගමිකභාවය පිළිබඳ පුරසාරම් කීව ද සිංහලයා ම සිංහල කොඩිය වෙනස් කළ ද, ජාතික ගීය දෙමළෙන් ගැයුව ද, අප තුළ මානව ධර්ම සනාථ වන බවක් පෙනෙන්නට නැත. ආක්‍රමණිකයාට එරෙහිව අවි එසවුව ද කිසි දිනක සිංහල සමාජය තුළ මනුෂ්‍යත්වයට එරෙහිව අවි එසවූ යුගයක් සඳහන් නො වේ. ජාති භේදය හිසින් නොගත් සිංහලයා මිය ගොස් ජාතිකානුරාගයක් නැති ශ්‍රී ලාංකිකයා ඉපිද ඇත්තේ සිංහලයා සතුව තිබූ උදාර මානව ධර්ම ද මරා දමමිනි.

මේ බරපතළ වැරදීමට පිළිතුරු සොයා නොගත හොත් අපි අතිශයින් ම අසරණ වන්නමු. මේ සඳහා විසඳුමක් මේ විකෘති සමාජයට නොමැත. බොහෝ රටවල පවතින මුදල් බලය නොමැති වූ දිනක ඔවුහු අන්ත අසරණ ය. මෙම නව පරිභෝජනවාදය මත යැපෙන දියුණු යැයි සම්මත රටවලට කිසිදු චින්තාමය ශක්‍යතාවක් පෙනෙන්නට නැත. දකුණු කොරියාවේ හෝ සිංගප්පූරුවේ හෝ මැද පෙරදිග රටවල හෝ ගායකයන්, සංගීතඥයන්, නවකතාකරුවන්, කවියන්, දාර්ශනිකයන් බිහි වන පරිසරයක් නොමැත. ඒවායෙහි ශේක්ෂ්පියර්ලා, තාගෝර්ලා, මිලාරේපාලා, කුමාරතුංගලා, අමරදේවලා බිහිවීම සිහිනයකි. ඔවුහු ධනය හා බලය පමණක් ආගම කොට අදහති. ඒවා අහිමි වූ දිනක ඔවුහු නොදියුණු මිලේච්ඡයන්ටත් වඩා අන්ත ය.

ආර්ථික හා තාක්‍ෂණික සංවර්ධනයට එරෙහිව අපට පසු ගමන් කිරීමට නොහැකිය. අපි කුමක් කළ යුතු ද? දලයි ලාමාතුමා මෙසේ කියයි.

"ආර්ථික හා තාක්‍ෂණික සංවර්ධනය අත්‍යවශ්‍ය මෙන් ම පැතිය යුත්තකි. එය අපට පාලනය කළ නොහැකි සංකීර්ණ සාධක රාශියක ප්‍රතිඵලයකි. එම දියුණුව හදිසියේ නතර කරමින් ප්‍රශ්නය විසඳිය හැකි යැයි යමෙකු සිතතොත් එය මහ ම මුළාවකි. එහෙත් එම දියුණුව ඊට අවශ්‍ය ආකාරයට ම සිදු විය යුතු නොවේ. එය පැමිණිය යුත්තේ ඊට සමගාමීව එන සදාචාර වටිනාකම් පද්ධතියක් හා බද්ධ වෙමිනි. යථෝක්ත දෙයාකාර කාර්යය සාර්ථක අසාර්ථක කර ගැනීම මනුෂ්‍යයන් වන අප සතු වගකීමකි. මනුෂ්‍ය සමාජයේ අනාගත යතුර වන්නේ එය යි. ද්‍රව්‍යමය හා ආධ්‍යාත්මික දියුණුවත් එකට පැවතිය හැකි සමාජයක් නම් එය වචනයේ නියම අරුතින් ම තෘප්තිමත් වූ සමාජයක් වන්නේ ය."

***- දලයි ලාමාතුමන්***

***හෘදයංගම උපදේශ - පරිවර්තනය : මණ්ඩාවෙල පඤ්ඤාවංශ හිමි***

මෙම සමාජ ප්‍රවාහය උඩුගම් බලා හැරවීමට නොහැකි බව පැහැදිලි ය. එහෙත් එම සමාජ ප්‍රවාහයේ අරමුණු හා අපේක්‍ෂාවන් වඩා උත්තරභාවයට පත් කිරීම නොහැකි නොවේ. වර්තමානයේ මෙම ව්‍යසනය නිසා පීඩිත ලෝකය මේ පිළිබඳ තරමක් සංවේදී වෙමින් පවතී. මුහුණු පොත, YOU TUBE වැනි සමාජ ජාල පුරා පසුගිය සමයේ මානවවාදය (Humanity) පිළිබඳ විශාල සංවාදයක් ඇති වූ අතර ඒ පිළිබඳ විවිධ වීඩියෝ පට, දේශන දහස් ගණනකින් හුවමාරු විය. තවමත් හුවමාරු වේ. මෙම ආනයනිත විසඳුම් අන් කිසිවක් නොව සිංහල සමාජය පුරා සුවඳ දුන් බෝධිසත්ත්ව චර්යාව යි. මේ අපගේ ම මූලය යි. අපේ ම මුල් සිඳගත් ජාතියට අද

මුහුණු පොතින්, අන්තර්ජාලයෙන් (Humanity) උගෙනීමට සිදු වීම දෛවයේ සරදමක් සේ ය.

අප බෝසත් ගුණ නැවත දිවමන් කරවිය යුතු කාලය එළඹ ඇත. නැතහොත් අපට අන්ත අසරණව මියැදෙන්ට සිදු වනු ඇත. ඊට පෙර නිවන් අවබෝධය තෙක් බෝසත් මනු දම් පුහුණු කිරීමට හැකි නම් සතුටුදායක මරණයක් හෝ අපට උරුම වනු ඇත. බෝසත් ගුණ පුහුණු කිරීම යනු බුදු බව පැතීම ම නොවේ. අනාදිමත් කාලයක පටන් මහා මානව පරම්පරාවකට නිදුකින් ජීවත් වන්නට ඉගැන්වූ පරමාදර්ශ හඳුනා ගැනීම යි. හෘද සංවේදී මනුෂ්‍යයෙකු වීම යි. ස්වකීය හෘද සාක්ෂියෙහි ලා අනාථ නොවන සනාථ මනුෂ්‍යයෙකු වීම යි.

අද යුගයේ බුද්ධ ධර්මය ඉගෙනීම ඉහළ ලකුණු සාමර්ථ්‍යයක් ලැබීමට පමණක් සීමා වී ඇත. මෙය විෂය නිර්දේශයක් විනා උදාර මානව සම්ප්‍රදායකට අනුප්‍රාණය සැපයූ ප්‍රායෝගික ජීවන දර්ශනයක් බව අද බොහෝ දෙනාට අමතකව ඇත. මීට වඩා යාන්තමින් හෝ සතුටුදායක ප්‍රතිරූප දේශයක් උදෙසා බෝසත් ගුණ වැඩීම පිණිස ඇත්වැල් බැඳිය යුතු කාලය එළඹ ඇත. මේ සමාජ දේහය තුළ අතිශය පීඩිතව පිපාසිතව සිටින බොහෝ අසරණ සත්ත්වයෝ ඇත. එහෙත් ඔවුනට මඟ නොමඟ කියන්නට සමත් අව්‍යාජ අකලංක හැඟීමෙන් කටයුතු කරන පරමාදර්ශී පෙරගමන්කරුවන් පිරිසක් නොමැත. මේ ඒ සම්මා වායාමයට එරෙහිව නැඟෙන පිළිමලුන් සිඳ බිඳ අසරණ මනුෂ්‍ය පරම්පරාවකට බෝසත් ගුණ සම්ප්‍රදානය කළ හැකි පරමාදර්ශී මිනිසුන් ජාතිය අපේක්ෂා කරන මොහොත යි. එය මේ යුගයේ පිරිය හැකි උතුම් ම පාරමිතාවකි. මිනිහා හදා රට හදන මහ ම මහ පින්කමකි. මිනිසියාව සරු කොට සැබෑ ලෙස ම රට සංවර්ධනය කිරීමකි.



# ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා

*"මුතු සීයා" විසිනි*

ක්‍රිස්තු වර්ෂයෙන් දහ අට වැනි සියවසේ සිට විසිවැනි සියවස දක්වා අතර කාල පරිච්ඡේදය ශ්‍රී ලංකාවට අභාග්‍යසම්පන්න කාලයක් වූයේ පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයන් යටතේ මුහුදුබඩ ප්‍රදේශයන් පාලනය වූ හෙයිනි. ඔවුන'තරින් සිංහලයාට වඩාත් ම බැට කන්නට සිදු වූයේ ඉංග්‍රීසි පාලකයන් ගෙනි. ක්‍රිස්තු වර්ෂ 1815 දී අප රට සම්පූර්ණයෙන් ම ඉංග්‍රීසීනට යටත් රාජ්‍යයක් විය. සිංහලයෝ රැකියා හා තාන්න මාන්න ලබා ගැනීමට ක්‍රිස්තියානි ආගම වැලඳ ගත්හ. බටහිර ක්‍රමයට හැඩගැසුණු ඔවුහු සිංහල සිරිත්-විරිත් අගය නො කළහ. යුරෝපීය ඇඳුම්-පැළඳුම්වලට කැමැත්තක් දැක්වූහ. කෙටියෙන් කිවහොත් මුළුමනින් ම සංකර වූහ.

සිංහල බෞද්ධයනට සිංහලකමත් බෞද්ධකමත් දෙක ම අමතකවී හෝ ඕනෑකමින් අමතක කොට බටහිර ජාතීන් ගේ සපත්තුවට යටවී පරාධීන ව නිවට ව සිටි යුගයක ය, ජාතියේ පිනට ජාතියේ මුර දේවතාවා වූ ධර්මපාල තුමා පහළ වූයේ.

මාතර හිත්තැටියේ විසූ දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමාගේත් මල්ලිකා හේවාවිතාරණ ළමාතැනිය ගේත් පුත්‍රයා

වශයෙන් මෙතුමා උපත ලැබුවේ 1864 සැප්තැම්බර් 17 වැනිදා ය. ඔහුට මුලදී දෙමාපියන් විසින් එකල භාවිතයට අනුව දෙන ලද්දේ ඩේවිඩ් යන ඉංග්‍රීසි නාමය යි. එකල බෞද්ධ පාසල් හෝ රජයේ පාසල් නොතිබුණු යුගයක් වූයෙන් කුඩා ධර්මපාලට උගැනීමට සිදු වූයේ එවකට තමන් පදිංචි වී සිටි කොටහේනට ආසන්න ව පිහිටි ක්‍රිස්තියානි පාසල්වල ය.

පිළිවෙලින් දෙමටගොඩ බැප්ටිස්ට් සිංහල පාසල, කොටහේනේ ශාන්ත බෙනඩික් විදුහල සහ කෝට්ටේ ක්‍රිස්තු විදුහල යන පාසල්හි ඔහු ඉගැනුම ලැබී ය. කොටහේනේ සහ කෝට්ටේ විදුහල්වලදී ඉංග්‍රීසී අධ්‍යාපනය ලැබූ නිසා ම එතුමාට ඉංග්‍රීසී පාලකයන් යටතේ ලිපිකරු තනතුරක් ලද හැකි විය.

බෞද්ධයන් හා ක්‍රිස්තු භක්තියකයන් අතර පාණදුරා වාදය නමින් වූ ආගමික වාදයක් පැවතියේ මේ කාලයේ ය. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් සමග ඩේවිඩ් තරුණයා ද එම වාදයට සවන් දීමට ගියේ ය. "ඉංග්‍රීසි පාලකයන් ගේ ගැත්තෙක් නො වෙමි" යි පවසමින් ඔවුන් ගෙන් ලද ලිපිකරු තනතුර ඔහු අත හැරියේ ද මේ අවධියේ දී ය.

පාණදුරා වාදය ගැන අසන්නට ලැබී ලංකාවට පැමිණි ඇමෙරිකන් ජාතික සෙන්පති ඕල්කට් තුමා ගේ සහ රුසියානු ජාතික බ්ලැවට්ස්කි මැතිනිය ගේ ඇසුර ඩේවිඩ් තරුණයාට ලැබුණේ ද මේ කාලය තුළ ය. ඔවුන්ගේ පරමවිඥානාර්ථ බෞද්ධ සමාගමට බැඳුණු ඔහු, ඕල්කට් තුමාගේ කථා සිංහලයට පරිවර්තන කිරීමේ කාර්යයෙහි යෙදුණේ ය. ඔහු ඩේවිඩ් යන නාමය අත හැර ආර්ය සිංහල නමක් වූ ධර්මපාල යන නම භාවිතයට ගත්තේ ය.

ජාතික සිරිත් විරිත් සහ ආර්ය සිංහල නම් භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරමින් එතුමා රට පුරා දේශනා පැවැත්වී ය. එතුමන් ගේ කථා බොහෝ විට වේගවත් විය. නිර්දය ප්‍රහාරාත්මක ස්වරූපයක් ද ගත්තේ ය.

ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන වන්දනා කිරීමට ගිය අනගාරික ධර්මපාල තුමාට බුද්ධගයා විහාරය හින්දූන් ගේ දේවාලයක් වශයෙන් පුද පූජා පැවැත්වීමට යොදා ගනු දක්නට ලැබුණි. එයින් මහත් සේ කම්පාවට පත් වූ එතුමා හින්දු මහන්තා ගෙන් බුද්ධගයාව බේරා ගැනීමේ අභීත සටන ඇරඹී ය.

**"සිංහලයිනි නැගිටිව්. බුද්ධගයාව බේරා ගනිව්!"** යන සටන් පාඨය පෙරදැරි කරගෙන, 1891 දී මහාබෝධි සමාගම ආරම්භ කොට, ලෝකවාසී බෞද්ධයන් ගේ සහාය ද ලබා ගෙන, නීතී මාර්ගයෙන් කටයුතු කොට හින්දු මහන්තාගෙන් බුද්ධගයාව බේරා ගැනීමට අනගාරික ධර්මපාල තුමා සමත් විය.

අනගාරික ධර්මපාල තුමන්ගේ තවත් උදාර මෙහෙයක් වූයේ, ගව ඝාතනයට සහ මද්‍යපානයට එරෙහි ව කළ සටන ය. එතුමන්ගේ ප්‍රචාරක රථයේ, "හරක් මස් නොකනු" යන පාඨය ප්‍රදර්ශනය කර තිබිණි. හරක්මස් කන්නන් හා මත්පැන් බොන්නන් වසලයන් හැටියට ය, අනගාරික ධර්මපාල තුමා සැලකුවේ.

1906 දී බෞද්ධ ජනමතය ප්‍රචාරය කිරීම සඳහා "සිංහල බෞද්ධයා" නමින් පුවත්පතක් ඇරඹී ය. අනගාරික ධර්මපාල තුමා පොදුවේ සිංහල ජාතියටත් වෙන් වෙන් ව බෞද්ධ කාන්තාවනට සහ දරුවනට උපදෙස් දෙන ලිපි රාශියක් මේ පුවත්පතට සැපයී ය.

1915 දී ලංකාවේ සිංහල-මුස්ලිම් කෝලාහල ඇරඹුණ විට අනෙකුත් ජාතික නායකයන් සමග ඉන්දියාවේ සිටි අනගාරික ධර්මපාල තුමන් ද සිරභාරයට ගන්නා ලදුව වසර හතක් නිවාස අඩස්සියේ තබන ලදී. ඒ කාලය තුළ දී එතුමා ආගමික කටයුතුවල නිරත විය.

1931 දී අනගාරික ධර්මපාල තුමා තමාගේ මූලිකත්වයෙන් අරඹන ලද මූලගන්ධකුටි විහාරයේ දී සිරි දේවමිත්ත ධම්මපාල නමින් පැවිදි වී 1932 දී උපසම්පදාව ලැබීය. 1933 දී රෝගී වූ උන්වහන්සේ, එම වසරෙහි අප්‍රේල් මස 29 වැනි දා අපවත් වූහ.

## මුතු සීයාගේ වියොව

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිසල් මෙහෙවරක් සිදු කළ, අධ්‍යාපනඥයකු, ප්‍රකට ලේඛකයකු වූ නන්දසිරි මුතුකුමාරණ සූරීහු පසුගිය ජූනි මස 15 වන ද ඇමෙරිකාවේ දී අභාවප්‍රාප්ත විය.

1930 ජනවාරි 23 වන ද මාතර වල්පොල දී උපත ලැබූ එතුමා මාතර රාහුල විදුහලින් අධ්‍යාපනය ලබා එහි ම උප ගුරුවරයකු, නියෝජ්‍ය විදුහල්පතිවරයකු ලෙස ද සේවය කොට පසු ව මාතර පඹුරන ශාරිපුත්‍ර විද්‍යාලයයේ විදුහල්පති තනතුරට පත් විය. පසු කලෙක නැගෙනහිර කොළඹ අධ්‍යාපන නිලධරයා වශයෙන් ද අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන පීඨ ශාඛාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් ද උසස් වීම් ලද එතුමා කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ධර්ම පරීක්ෂණ අධිකාරිවරයා ලෙස වසර 15 ක් සේවය කළේ ය.

සැදැහැවත් බුදුනුවකු වූ නන්දසිරි මුතුකුමාරණ මහතා දරුවන් ගේ චරිතායන අධ්‍යාපනයට අත් වැලක් වන අයුරින් ළමා මනස උදර අදහස්වලින් පෝෂණය කරනු සඳහා සිය පරිගණකය භාවිත කරමින් ලියූ සිංහල හා ඉංගිරිසි ලිපි සංඛ්‍යාව ඉතා විශාල ය. බෞද්ධ ළමයා සඟරාවේ "මුතු සීයා" නමින් වරින් වර අගනා ලිපි මාලාවක් ලියුවෝ නන්දසිරි මුතුකුමාරණ සූරීහු ය.

එතුමා කළ මෙහෙවර කෘතවේදී ව සිහිපත් කරමින් එතුමා ගේ අභාවය වෙනුවෙන් 'බෞද්ධ ළමයා' ගේ බලවත් සංවේගය ද පළ කරමින්, අනගාරික ධර්මපාල සිරිතුමන් පිළිබඳ ව එතුමා ලියූ ලිපිය මෙහි ලා පළ කරන ලද්දේ එතුමාට උපහාර පිණිස ය.

- සකසු -



# Sumana
# The Garland Maker of Rajagaha

(DHAMMAPADA V - 68)

Compiled by: ***Srima Warusawithana***

*Calgary, Canada*

Eight baskets of jasmine blooms – "Sumana" the garland-maker of Rajagaha
Brought to King Bimbisara's palace every morning, devotedly performed this task
And in return the king gave a few gold coins as a fee to him;
One day, Sumana observed the Buddha with the community of monks
Apporoaching towards him; He was very happy seeing the Buddha and his disciples.
He thought to offer those beautiful fragrant flowers to the blessed one and his disciples;
But he hesitated, recurring the following thoughts.
"If I do not take these flowers to the King I will be punished or imprisoned;
But I shall nevertheless bear it – even forsake my life,
I will offer these flowers to the Buddha and He flung the flowers up into the sky...
Miraculously the flowers formed an awning sweety and beautifully
People gazed at the Buddha wonderfully passing by them chanting "sadhu sadhu"
The Buddha and the bhikkhus entered Rajagaha's royal city street
Where King Bimbisara himself saw this amazing spectacle;
Where at the garland maker summoned by the King was asked
Why no flowers were supplied to the palace that day
When Sumana recounted his act of sheer devotion to the Buddha;
The King delighted and overwhelmed by the words of the simple garland maker
Rewarded him with costly gifts and gold...a happy life on earth he lived....
Thera Ananda, expressing thoughts on that extraordinary scene
Heard the Buddha's words of wisdom ring sharp and clear;
"Do not regard this as an act of little worth; Sumana not only offered flowers,
But offered his own life as well; by merits accrued from this profound act
He shall be born in the heavenly realms and thereafter one day
In aeons to come, end his samsaric life as Sumana - a silent Buddha.
*"That deed is well done, when being done one has not to repent/regret,*
*And when one can reap with joy the sweet fruits of the right deed*
*Such wholesome deeds bring forth happiness"*